




**විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර**

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව




## ස්නේහාගේත් අකලංකගේත් කතාව

> "යන්න එපා.. මං කියන දේ අහන්න.. මං වැරැද්ද බාරගන්නවා.. අපේ අතින් ඔයාට වුණේ ලොකු වරදක්.. මං ඒක පිලිගන්නවා.. පිලිගන්නවා විතරක් නෙවෙයි.. ඒ වරද නිසා ඔයාට වුණ පාඩුව වෙනුවෙන් හිත් රිදීම වෙනුවෙන් මට කරන්න පුලුවන් හැම දෙයක්ම මම කරනවා.. මාව විශ්වාස කරන්න"

කියන්නට යමක් සිතට නොඑයි. සියුම් කෝපයක් වැනි හැඟීමක් ඇයට දැනෙයි. මේ විහිලුවට දුර දිග යන්නට නෙද්දට නොහැකි ය. ස්නේහා දුරකතනය විසන්ධි කළා ය. විසකුරු සර්පයකු විසි කරන්නාක් මෙන් දුරකතනය ඇඳ මතට විසි කර දැමුවා ය. එය නැවත නැවතත් නාදවනු ඈ ගල්ගැසී බලා සිටියා ය.

"ඇයි ෆෝන් එක ගන්නැත්තෙ ...?" එවර අකලංකගේ හඬ ඇසුණේ කාමරයේ දොර අසළින් ය. ඔහු කාමරයේ දොර රාමුව මැද සිටගෙන ස්නේහා දෙස සිනාසෙමින් බලා සිටියේ ය. ස්නේහාට එකවර හඳුණාගන්නට නොහැකි වන තරමට ඔහු වෙනස් වී සිටියේ ය. අකීකරු අවුල්ව ගිය කොණ්ඩය වෙනුවට මනා ලෙස පැත්තකට බෙදා පීරූ කොණ්ඩයත් ටයි පටිය සහිත ඇඳුමත් ඔහුගේ රුවට අසාමාන්‍ය තැන්පත් පෙනුමක් ලබා දී තිබුණි. මද වේලාවක් බලා සිටි ඔහු ගල්ගැසී බලා සිටිනා යුවතිය අසළට සෙමින් පියමැන්නේ ය. ඇඳ මත වූ දුරකතනය අතට ගත් ඔහු එය ස්නේහා අතට දුන්නේ ය. ඈ යාන්ත්‍රිකව එය අතට ගත්තා ය. ඔහු ඉන්පසු ඇඳ මත වාඩි වූයේ ය.

"ඔයා නැති දවස් වලත් මං සැරින් සැරේ ඇවිත් මේ ඇඳේ වාඩි වෙලා හිටියා.." ඔහු කීවේ ය. "... වාඩි වෙලා ඔයා අර මල් පෝච්චියට මල් දාන හැටි හිතින් දකිමින් හිටියා"

"පිස්සු කියන්න එපා සර්.. මං යනවා.." ස්නේහා දොර වෙත යන්නට සැරසුණා ය. ඔහු වහා නැගිට ඇගේ ගමන් මග හරස්කර සිටගත්තේ ය.

"යන්න එපා.. ප්ලීස්.. මට කතාරන්න ඕනෙ" ඔහු බැගෑපත් විය.

"සර් මේ මගේ ඩියුටි වෙලාව.. අන්තිමේ මාව රස්සාවෙන් අස්කරලම දායි" ඇය කීවේ ඇත්තටම සිතුණ දේ ය. ඔහු සැහැල්ලුවෙන් සිනාසුණේ ය.

"එහෙම වෙන්නෑ..එහෙම වෙනවනම් වැඩි පඩියකුත් ගෙවලා ඔයාව ආයෙම මෙහෙ වැඩට ගන්නෙ නැහැනෙ" ඔහු ඒ සිනාවෙන්ම කීවේ ය. ස්නේහා ඔහු දෙස බලා සිටියේ පුදුමයෙනි.

"සර් කොහොමද දන්නෙ මගේ පඩි වැඩි කළ බව?" ඇය ඇසුවේ ඒ පුදුමය නිසාම ය.

"මං දැනගත්තා" ඔහු කෙටියෙන් කීවේ ය. "..මිස්ටර් සිරිවර්ධනගෙන් දැනගත්තා" ඔහු දෙවෙනුවට කීවේ මුල් පිළිතුර නොසෑහේ යයි සිතුණ නිසා ය.

ස්නේහා එය විශ්වාස නොකළා ය. සිරි වර්ධන මහතා එවැන්නක් කිසිවකුට නොකියන බව ඇය දනියි. ආයතනයේ රහස් පිටස්තරයනට එළිදරව් කිරීම වරදකි.

"බොරු කියන්න එපා සර්" ස්නේහා සිතට ආ දේ කෙළින්ම කීවා ය. "ඔයාල හරි දක්ෂ යි බොරු කියන්න.. එහෙම බොරු කියලනෙ මාව ගෙදර යැව්වෙ.. බොරු කියන එක ඔයාලට හරිම සිම්පල්.. අපි එහෙම නෑ සර්.. අපි බොරු කියන්නෙවත් බොරු කරන්නෙ වත් නැහැ" සිතේ තදකරගෙන සිටි කෝපය වචන වලට හැරී ගලා ආවේ කෙසේදැයි ඇයවත් නොදත්තා ය. ඔහු නිහඬව බලා සිටියේ ය. අසා සිටියේ ය. ඔහුගේ මුවේ ඇඳී තිබූ සුන්දර සිනාව මැකී ගොස් තිබුණි. ස්නේහාගේ ඇස්වල පිරුණ කඳුළු දෙකො පුල් ඔස්සේ ගලා ගියේ ය. ඒවා පිසදාගන්නටවත් නොවෙහෙසුණ තරුණිය දොර වෙත යන්නට හැරුණා ය. ඔහු සීරුවෙන් ඇගේ අතින් අල්ලාගත්තේ ය. "යන්න එපා.." ඔහු පහත් හඬින් කීවේ ය. ඔහුගේ අත ගලවා ගන්නට ස්නේහා කීප වතාවක් උත්සාහ කළා ය.

"යන්න එපා.. මං කියන දේ අහන්න.. මං වැරැද්ද බාරගන්නවා.. අපේ අතින් ඔයාට වුණේ ලොකු වරදක්.. මං ඒක පිලිගන්නවා.. පිලිගන්නවා විතරක් නෙවෙයි.. ඒ වරද නිසා ඔයාට වුණ පාඩුව වෙනුවෙන් හිත් රිදීම වෙනුවෙන් මට කරන්න පුලුවන් හැම දෙයක්ම මම කරනවා. මාව විශ්වාස කරන්න" ඔහු කීවේ ය. ඒ කටහ ඬෙහි තිබූ ස්ථාවර බව ඇය මොහොතකට දමණය කරන්නට සමත් විය.

යුවතිය කඳුළු පිරි දෑසින්ම ඔහු දෙස බැලුවා ය.

"මොකුත් කරන්න ඕනෙ නැහැ සර්... මට මගේ පාඩුවෙ ඉන්න දෙන්න.. ඒ ඇති.. ඒ හොඳටම ඇති" ඈ ඇඬුම අතරින්ම කීවා ය.

"මට සමාවෙන්න ස්නේහා.. විශ්වාස කරන්න.. මගේ ජීවිතේ පලමුවෙනි වතාවටයි මං මේ කෙනෙක්ගෙන් සමාව ඉල්ලන්නෙ.. ප්ලීස්. . මගේ අතින් වෙච්ච වරද හදාගන්න මට ඉඩ දෙන්න" ඔහු නැවතත් බැගෑපත් විය.

"වෙච්ච හැම දෙයක්ම වෙලා ඉවරයිනෙ.. දැන් සර්ට කරන්න පුලුවන් දෙයක් නැහැ.. අනේ මට මගේ පාඩුවේ මේ රස්සාව කරගෙන ඉන්න ඉඩදෙන්න.. එච්චරයි සර්ට මා වෙනුවෙන් කරන්න පුලුවන්. එච්චරයි මං සර්ගෙන් ඉල්ලන්නෙ" ඈ කීවා ය. ".. සර්ල ලොකු මිනිස්සු.. අපට ඔයාල එක්ක හැරෙන් නවත් බැහැ.. සර්ල ඉස්සරහදි අපි හරිම පුංචියි.. අපි වගේ පුංචි මිනිස්සුන්ට කරදර නොකර ඉන්න.. ඒ ඇති"

අකලංක පළමු වතාවට ස්නේහා ගේ දෙඋර මත තම දෑත් තැබුවේ ය. ඉන්පසු ඇගේ දෑස් තුළට එබී බැලුවේ ය.

"මෙතනට ලොකු පොඩි කම් ඕනෙම නෑ ස්නේහා" ඔහු මිමිණුවේ ය. "..මං ඔයා ළඟින් ඈත් වෙන්නෙ නැහැ.. ලෝකෙ පෙරළුණත් මං ඔයාගෙන් ඈතට යන්නෙ නැහැ"

ස්නේහා යමක් කියන්නට උත්සාහ කළා ය. ඒ අසාර්ථක උත්සාහය අතරේ කාමරයේ දොර අසළින් ඇසුනේ සිනා හඬකි.

"නියම සීන් එක.. හින්දි ෆිල්ම් එකක වගේ"

**මතු සම්බන්ධයි**

